**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - 2016**

---------------------------------------------------------------------------

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 15 දරන පනතින් හා 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මවිසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

---------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 අනෙකුත් නීතිමය හා නියාමන අවශ්‍යතා මත වාර්තා

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු පනත හා ඊට පසු සිදුකල සංශෝධන අනුව අවශ්‍යකරණ තොරතුරු ඉදිරිපත් කර ඇත.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------------

පහත දැක්වෙන එක් එක් අයිතමය වෙනුවෙන් පෙන්වා දී ඇති ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | සාක්ෂි නොමැති වීම |
|---|---|---|
| බැංකුවේ මුදල් | | |
| - ඩච් බැන්ක් සින්කින් | 454,106 | බැංකු ශේෂ තහවුරු කිරීම |
| - ලංකා බැංකු රූස්කිරීමේ ගිණුම (Mit) | (210,679) | බැංකු සැසඳුම් වාර්තා, බැංකු ප්‍රකාශන |
| අනෙකුත් ආයතනවලට ගෙවිය යුතු ශේෂ | 2,406,465,176 | ශේෂ තහවුරු කිරීම |
| අනෙකුත් ආයතනවලින් ණය ගැනීම | 35,170,740 | ජාතික රක්ෂණ සංස්ථාව හා සුදු නෙළුම් ව්‍යාපාරය සමඟ ගිවිසුම් |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

(අ) සමාන මාසික වාරික අතිරික්ත ගිණුමේ (Equal Monthly Instalments Excess Account) රු.12,181,978 ක් වූ වැඩිපුර ණය අයකර ගැනීම් වර්ෂයකට වැඩි කාලයක් ණයුදෙනුකරුවන් ආපසු ගෙවීමෙන් තොරව පැවතුණි.

(ආ) බැංකුවේ සාමාන්‍ය පරිචයක් ලෙස, මුදල් අත්තිකාරම් හා චෙක් අත්තිකාරම් පිළිවෙලින් දින 14 ක් හා දින 22 ක් තුළ නිරවුල් කල යුතුය. කෙසේ වුවද, 2016 දෙසැම්බර් 31 දිනට විවිධ කාර්යයන් සඳහා බැංකුව විසින් ලබාදුන් එකතුව පිළිවෙලින් රු.455,125 ක් හා රු.4,459,266 ක්වූ මුදල් අත්තිකාරම් හා චෙක් අත්තිකාරම් නොපියවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් බැරකම් යටතේ දැක්වෙන රු.17,953,267 කින් රු.6,178,828 ක මුදලක් නිරවුල් කිරීමකින් තොරව වර්ෂ 03 කට වැඩිකාලයක් ගිණුම්වල පැවතුණි.

(ඇ) ගණුදෙනුකරුවන්ගෙන් අයකරගත් රු.1,294,144 ක් වූ මුද්දර ගාස්තු නිරවුල් කිරීමකින් තොරව වර්ෂ 03 කට අධික කාලයක් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(ඉ) රු.896,175 කින් සියයට 68 ක්වූ රු. 613,325 ක් සහ සියයට 24 ක්වූ රු.219,100 ක මුදලක් පිළිවෙලින් වර්ෂ 5 සිට 10 දක්වා හා වර්ෂ 10 කට අධික කාලයක් තැන්පතු ගිණුමේ ලැබිය යුතු ශේෂ වශයෙන් පැවතුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම තැන්පතු සම්බන්ධයෙන් තහවුරු කිරීම් ලබා ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට විශේෂ ණයගැති ගිණුමේ හිඟහිටි ශේෂය රු.736,405 වූ අතර, ඉන් රු.144,958 ක් 2006 සිට හිඟ හිටි ලෙස පැවතුණි.

## 2.4 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ iv කොටසේ 16(2) වගන්තිය | බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනය රු.මිලියන 1,000 ක් විය යුතුයි. කෙසේ වුවද, 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.962,092,936 ක් විය |
| (ආ) | බැංකු පනතේ 6.1 උපදෙස් මාලාවේ 4(1)(iv) වගන්තිය, 2012 අංක 02 දරන උපදෙස් මාලාව සහ 2014 බැංකුවේ බාහිර සේවා ලබාගැනීමේ ප්‍රතිපත්තිය | බැංකුවේ ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට බාහිර සේවා ආයතනයක් තෝරාගැනීමේදී බැංකුව මෙම ප්‍රතිපාදනවලට අනුකූල වී නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 133 (4)(අ) වගන්තිය හා ඊට අදාල වන සංශෝධන | 2016 වර්ෂය තුල බැංකුව විසින් අදාල කරගත් රඳවාගැනීමේ බදු ප්‍රතිපත්ති පනතේ අවශ්‍යතාවයන් හා එකඟ නොවුණි. |
| (ඈ) | 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/19 දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) 10 (බී) දරන පරිච්ඡේදය | 2015 ජූලි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලසීමාව සඳහා සේවක පාරිශ්‍රමික වලින් අය කරගෙන තිබූ රු.233,450 ක් වූ මුද්දර ගාස්තු 2017 මාර්තු 24 වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඉ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) 10 වන පරිච්ඡේදය | 2015 ජූලි 01 දින සිට 2016 සැප්තැම්බර් 30 දක්වා කාලය තුල පාරිභෝගිකයන්ගෙන් එකතු කර තිබූ රු.1,062,575 ක්වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ණය පහසුකම් පියවන අවස්ථාවේදීවත් ප්‍රේෂණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | මූල්‍ය ක්ෂේත්‍රයේ නියමු සැලැස්ම ඒකාබද්ධ කර ගැනීම සම්බන්ධයෙන් නිකුත් කල 2014 ජනවාරි 17 දිනැති අංක 02/17/402/0073/002 දරන ශ්‍රී ලංකා මහ බැංකු උපදෙස් මාලාව | 2018 ජනවාරි 01 දිනට බැංකුව රු.මිලියන 5,000 ක මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු වුවද, මෙම අවශ්‍යතාවය පිළිපැදීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ.) 757 (2) | බැංකුව එහි ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික පැවැත්ම පරික්ෂා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක පීඩීර්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>------------------------------------------ | |
| | (i) 5 පරිච්ඡේදයේ 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භවීමට මාස තුනකට පෙර කෙටුම්පත් අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වුවද බැංකුව එයට අනුකූල වී නොතිබුණි. 2016 වර්ෂය සඳහා අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණේ 2015 දෙසැම්බර් 18 දිනදීය. |
| | (ii) 9 පරිච්ඡේදයේ 9.2 (ආ) හා (ඇ) ඡේද | ආයතනයක් සඳහාම අනුමත කාර්ය මණ්ඩලය සැලැස්මක් සහිතව අනුමත කරන ලද සංවිධාන සටහනක් තිබිය යුතු අතර එය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල යුතුයි. කෙසේ වුවද, බැංකුව මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. |
| | (iii) 9 පරිච්ඡේදයේ 9.3.1 ඡේදය | සෑම ව්‍යවසායක් සඳහාම බඳවා ගැනීම් පටිපාටියක් හා එක් එක් තනතුරු සඳහා උසස්වීම් පටිපාටියක් තිබිය යුතු අතර එම පටිපාටි මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය හා අදාල අමාත්‍යාංශය විසින් අනුමත කළ යුතුය. කෙසේ වුවද බැංකුවේ එවැනි පටිපාටියක් නොතිබුණි. |
| | (iv) 2006 රජයේ ප්‍රසම්පාදන මඟ පෙන්වීම් සහ 2009 ජුනි 04 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/429 (i) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව බැංකුව ප්‍රසම්පාදන කටයුතු සඳහා විශේෂ මිලදී ගැනුම් අත්පොතක් භාවිතා කරනු ලබයි. මේ අතරතුර, 2016 වර්ෂය තුල රජයේ ප්‍රසම්පාදන මඟපෙන්වීම් අනුගමනය කිරීම් වෙනුවට මෙම අනුමත නොකළ අත්පොත පදනම් කරගෙන බැංකුව රු.මිලියන 82 ක් වටිනා අයිතම 1,669 ක් මිලදී ගෙන තිබුණි. |

(ඒ) බැංකුවේ ණය අයකර ගැනීමේ අත්පොත

| | |
|---|---|
| 4.1.1 වගන්තිය | 2016 දෙසැම්බර් 31 දිනට බලය පවරාගත් දේපලවල මුළු වටිනාකම රු.23,291,154 ක් වූ අතර ඉන් සියයට 52 කට සමාන රු.12,138,322 ක දේපල වර්ෂ 10 කට වඩා පැවතුණි. |
| 4.1.5 වගන්තිය | බලය පැවරූ දේපල අභ්‍යන්තර තක්සේරුකරුවෙකු මගින් සෑම වර්ෂ 02 කට වරක් හෝ බාහිර තක්සේරුකරුවෙකු මගින් සෑම වර්ෂ 04 කට වරක් නැවත අගය කිරීම කල යුතුය. කෙසේ වුවද, රු.6,311,250 ක් වටිනා බලය පැවරූ දේපල අවශ්‍යතාවය පරිදි නැවත අගය කිරීමකින් තොරව වර්ෂ 2-6 දක්වා කාලසීමාවක් පැවතුණි. |
| 3.4.7 වගන්තිය | බලය පැවරූ දේපල වෙන්දේසි කිරීමෙන් ලැබෙන අතිරික්ත මුදල් අදාල පාරිභෝගිකයන්ට ගෙවිය යුතුයි. කෙසේ වුවද, බැංකුව විසින් සමාලෝචිත වර්ෂය තුල එසේ එකතු කල රු.472,448 ක් අදාල පාරිභෝගිකයන්ට ගෙවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 848 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 1,009 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 161 ක එනම් සියයට 16 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම හා අනෙකුත් ආදායම වැඩිවීමට සාපේක්ෂව පොලී වියදම හා ණයවලට අදාළ හානිකරණ ගාස්තු සහ අනෙකුත් පාඩු සැලකිය යුතු ලෙස වැඩිවීම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පහත දැක්වෙන වගුව සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයේ විවිධ අදියරවලදී පැවති තොරතුරු අනුව සාරාංශගත මූල්‍ය ප්‍රතිඵල දක්වනු ලබයි.

| **විෂයය** | **2016** | **2015 (නැවත සකස් කළ)** | **විචලනය වාසිදායක / (අවාසිදායක)** |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| පොලී ආදායම | 5,472 | 4,660 | 17 |
| පොලී වියදම | (3,509) | (2,539) | (38) |
| **ශුද්ධ පොලී ආදායම** | 1963 | 2,121 | (7) |
| ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 347 | 253 | 37 |

| | | | |
|---|---|---|---|
| අනෙකුත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 108 | 12 | 800 |
| **මුළු මෙහෙයුම් ආදායම** | 2,418 | 2,386 | 1 |
| ණය සහ අනෙකුත් හානිකර ගාස්තු | 161 | 89 | (81) |
| පාඩු | - | - | - |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | 2,257 | 2,297 | (2) |
| කාර්ය මණ්ඩල වියදම් | 895 | 829 | (8) |
| වෙනත් වියදම් | 514 | 459 | (12) |
| **එකතු කල අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය** | 848 | 1,009 | (16) |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | 188 | 206 | 9 |
| බදු වියදම් | 270 | 294 | 8 |
| **වර්ෂය සඳහා ලාභය** | 390 | 509 | (23) |

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**වැදගත් ගිණුම්කරණ අනුපාත**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා බැංකුවේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 6.58 ක් ලෙස වාර්තා වූ අතර එය අංශයේ අනුපාතය වූ සියයට 9.31 ට වඩා පහළ අගයක් විය.

(ආ) සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය අංශයේ සාමාන්‍යය වූ සියයට 1 සමඟ සසඳන විට සියයට 0.89 ක් ලෙස නියෝජනය වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 33 කින් අඩුවී තිබූ බව දක්නට ලැබුණි.

(ඇ) කොටස් හිමියන්ගේ අරමුදල් සාමාන්‍ය මත ප්‍රතිලාභය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 32 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ඈ) පසුගිය වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂය අවසානයේදී කොටසක ඉපැයීම හා කොටසක වෙළඳපල අගය පිළිවෙලින් සියයට 23 කින් හා සියයට 30 කින් අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අක්‍රීය ණය හා අත්තිකාරම් (NPL)**

2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය හා අත්තිකාරම් රු.මිලියන 31,052 ක් වූ අතර ඉන් රු.මිලියන 5,300 ක් හෙවත් සියයට 17.58 ක් අක්‍රීය ණය හා අත්තිකාරම් විය. කෙසේ වුවද, 2015 සහ 2014 වර්ෂ අවසානයේදී එය පිළිවෙලින් සියයට 20.77 ක් හා සියයට 22.57 ක් විය.

**(ආ) බැංකුව ණය ගැනීම**

ලැබී ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ 04 ක් සඳහා ස්කන්ධ ණය අනුපාතය පහත දැක්වේ.

| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මුළු ණය ගැනීම් | 8,863 | 9,037 | 6,213 | 5,257 | 3,214 |
| කොටස් හිමියන්ගේ අරමුදල | 3,728 | 3,364 | 2,886 | 2,575 | 2,391 |
| ස්කන්ධයට ණය අනුපාතය | 2.38 | 2.69 | 2.15 | 2.04 | 1.34 |

2016 වර්ෂයේදී කොටස් හිමියන්ගේ අරමුදල සියයට 10.82 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වර්ෂය හා සැසඳීමේදී බැංකුවේ මුළු ණය ගැනීම් සියයට 1.9 ක සුළු අඩුවීමක් පෙන්වනු ලබයි. පසුගිය වර්ෂ 04 තුල ක්‍රමානුකූලව වැඩිවීමක් පෙන්නුම් කල බැංකුවේ ස්කන්ධ ණය අනුපාතය සැසඳීමේදී මෙම වර්ෂයේ සියයට 11.52 ක අඩුවීමක් පෙන්වයි. එම නිසා, ඉහල ස්කන්ධ ණය අනුපාතය මගින් බැංකුව් මූල්‍යායනය ආක්‍රමණශීලී ලෙස ණය ලබාගැනීම් මගින් වර්ධනය වී ඇති බව සාමාන්‍යයෙන් පෙන්නුම් කෙරේ.

(ඇ) රු.7,372,852 ක් වූ සේවක අර්ථසාධක අරමුදලේ ණය මාස 18 කට වැඩියෙන් හිඟව තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලින් මෙම ණය ආපසු අයකර ගැනීමේ හැකියාවක් ඇතත්, 2016 දෙසැම්බර් 31 අවසන් වන විටත් එම ණය ශේෂ අයකර ගැනීම සඳහා බැංකුව විසින් සතුටුදායක පියවර කිසිවක් ගෙන නොතිබුණි.

(ඈ) බැංකුවේ අරමුණු ලඟාකර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ගණුදෙනුකරුවන්ගේ තැන්පතු, ණය හා අත්තිකාරම්, ශුද්ධ පොලී ආදායම හා බදුවලට පෙර ලාභය සම්බන්ධයෙන් ඉලක්ක හා සත්‍ය සංඛ්‍යා අතර සියයට 29 සිට සියයට 71 දක්වා විචලනයක් නිරීක්ෂණය විය.

විස්තර පහත දැක්වේ.

| අයිතමය | සංයුක්ත සැලැස්ම අනුව ඉලක්කය | සත්‍ය | විචලනය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | 45,450 | 32,123 | 29 |
| ණය හා අත්තිකාරම් | 50,500 | 30,260 | 40 |
| ශුද්ධ පොලී ආදායම | 3,334 | 1,960 | 41 |
| බදුවලට පෙර ලාභය | 2,252 | 660 | 71 |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාරිභෝගිකයන්ගෙන් අයකර ගැනිමකින් තොරව, සමාලෝචිත වර්ෂය තුල ණය පරිපාලන ගාස්තු රු.8,372,529 ක් පාඩු ලෙස කපා හැර තිබුණි. කෙසේ වුවද, මෙය පසුගිය වර්ෂවල උපලබ්ධි නොවූ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) රු.15,341,708 ක්වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම සඳහා පවරාගත් දේපල 31 ක් බැංකුව විසින් රු.14,418,413 කට අලෙවි කිරීම හේතුවෙන් රු.9,358,213 ක පාඩුවක් බැංකුවට දැරීමට සිදු වී තිබුණි.

(ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව බැංකුව විසින් සමාලෝචිත වර්ෂයේ රු.18,249,288 ක් වූ උපයන විට බදු ගෙවීම් (PAYE) අදාල නිලධාරීන්ගේ වැටුප්වලින් අයකර ගැනීම වෙනුවට බැංකුව විසින් එහි අරමුදල් වලින් අදාල නිලධාරීන් වෙනුවෙන් ගෙවා තිබුණි. 2016 දෙසැම්බර් මාසය සඳහා ගෙවන ලද ප්‍රසාද දීමනා මත ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු මුදල (PAYE) රු.3,205,619 ක් වුවද, බැංකුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රු.3,256,008 ක් ගෙවා තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රු.50,389 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.

(ඈ) සීමාසහිත ලංකා විදුලි බල සමාගමට ආරක්ෂිත තැන්පතු ලබාගැනීමකින් තොරව බැංකුව ප්‍රතිමූල්‍යායනය ණය පහසුකම් ලබාදී තිබුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට රු.731,385 ක්වූ පොලිය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) සී බැන්ක් යුනිට්හි ආයෝජනය කර තිබූ රු.25,000,000 සඳහා 2015 වර්ෂයේ සිට ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුවේ මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ලබාදුන් තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ කළමනාකාර, කණිෂ්ඨ විධායක සහ රියදුරු/ කාර්යාල කාර්ය සහයක වර්ගවල අතිරික්ත තනතුරු 09 ක් හා පුරප්පාඩු තනතුරු 54 ක් තිබූ බව අනාවරණය විය.

(ආ) 2016 වර්ෂය තුල iv ශ්‍රේණියේ බැංකු සහකාර නිලධාරීන් 04 දෙනෙකු සහ vi 2 ශ්‍රේණියේ බැංකු සහකාර නිලධාරියෙකු, සහකාර විධායක සහ සහකාර කළමනාකරු iv ශ්‍රේණියට උසස් කර තිබුණි. කෙසේ වුවද, මෙම තනතුරු බැංකුවේ වර්තමාන අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ ඇතුලත් වී නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 20 දින උසාවි ලිපිකරු තනතුර සඳහා සති අන්ත පුවත්පතක දැන්වීමක් පලකර තිබුණි. කෙසේ වුවද, තෝරාගත් අයදුම්කරුවන් 04 දෙනාගේ අයදුම්පත්‍ර පුවත්පත් දැන්වීම් දිනයට පෙර ඉදිරිපත් කර තිබුණි. පුවත්පත් දැන්වීම අනුව, අයදුම්කරුවන් අපොස (උසස් පෙළ) සාමාර්ථ 03 ක් ලබාගත යුතුව තිබූ අතර අපොස (සාමාන්‍ය පෙළ) ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථ ඇතුලත්ව සම්මාන සාමාර්ථ 05 ක් ලබාගත යුතුව තිබුණි. ඒ කෙසේ වුවත් ඉහත තනතුරු සඳහා තෝරාගත් අයදුම්කරුවන් මෙම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණි.

(ඈ) විධිමත් බඳවාගැනීම් පටිපාටි අනුගමනය නොකර බැංකුව විසින් ශාඛා කළමනාකරුවන් දෙදෙනෙකුගේ ඉල්ලීම මත 2016 වර්ෂය තුල කාර්යාල සහායකයින් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය පාලනය

අයවැය හා සත්‍ය සංඛ්‍යා අතර සියයට 7 සිට සියයට 52 දක්වා සැලකිය යුතු වෙනස්වීම් දක්නට ලැබුණු අතර බැංකුව විසින් අයවැය කාර්යක්ෂම අභ්‍යන්තර පාලන උපකරණයක් ලෙස භාවිතයට ගෙන නොමැති බව පෙන්නුම් කෙරුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| වත්කම් කළමනාකරණය | - ස්ථාවර වත්කම් ශාඛාවන්ගෙන් ශාඛාවන්ට මාරුකිරීම ක්‍රමවත්ව නඩත්තු කර නොතිබීම. |
| | - වත්කම්වල ඇතුලත් වී තිබුණද, සමහර වත්කම් භෞතිකව ශාඛාවල දක්නට නොලැබීම. |
| | - ඉවත් කිරීම් ලෙස සටහන් කළ සමහර වත්කම් ශාඛාවල භෞතිකව දක්නට ලැබීම. |
| | - 2016 දෙසැම්බර් 31 දිනට සමහර වත්කම් නව එකතු කිරීම් ලෙස බැංකුවේ දේපල අංශය විසින් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, භෞතික තහවුරු කිරීම්වලදී මෙම වත්කම් පැරණි වත්කම් කළමනාකරණ පද්ධතියෙන් ඉවත්කර තිබුණු අයිතම ලෙස හඳුනාගෙන තිබුණි. |
| | - මිලදී ගැනීමේ දිනය ක්ෂය කිරීම් සඳහා සැලකිල්ලට ගෙන නොතිබීම. |
| | - බැංකුවේ ඉවත් කරනු ලබන වත්කම් සඳහා සුදුසු ගිණුම්කරණ ක්‍රමයක් නොතිබීම. |
| | - මෝටර් රථ ඉවත් කිරීමට අදාල අනුමැතිය, ලැබුණු මුදල සහ බැහැර කළ දින පිළිබඳ ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම. |
| ශාඛා මෙහෙයුම් | - සමහර ශාඛාවල උකස් සේප්පු කාමරවල ආරක්ෂිත කැමරා සවිකර නොතිබීම. |
| | - පාටි ටොප් සහකාර මගින් ගිණුම් විවෘත කිරීමේදී අදාල ගනුදෙනුකරුට පාස්පොත භාරදුන් බවට සාක්ෂි ලබාගැනීමට නොහැකි වීම. |

| | |
|---|---|
| | - සමහර අවස්ථාවල ශාඛාවල පාටි ටොප් වෙනුවෙන් ප්‍රවර්ධන සහකාරවරු මුදල් එකතු කිරීමේදී රක්ෂණ සීමාව වන රු.300,000 ඉක්මවා ඇති බව නිරීක්ෂණය වීම. |
| පාරිභෝගික තැන්පතු | - සමහර "ධනනිධාන" ගිණුම්වල සහතිකයේ පරිණත දිනයෙන් පසුවද පොළී ගණනය කිරීම් සිදුකර තිබීම. |
| ගිණුම් කටයුතු | - මුද්දර ගාස්තු ගෙවීම් ගිණුමේ කාල විශ්ලේෂණය සහ වාර්තාව අතර වෙනස්කම් පවතිද්දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. |
| | - ණය මෙහෙයුම් අත්පොතේ 21 වගන්තිය අනුව උකස් ණය 408 ක සැකසීම් ගාස්තු ලැයිස්තු හා විගණන ගණනය කිරීම් අතර වෙනස්කමක් දක්නට ලැබීම. |